චී,චී,එය විසිකරනු.සැබැවින්ම අපි සකාත් දෑ අනුභව නොකළ යුතු බව ඔබ නොදන්නෙහි ද?

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. හසන් -රළියල්ලාහු
අන්හු- තුමා සකාත් ඉඳිවලින් ඉඳි ගෙඩියක් රැගෙන තම කටට දමා ගත්තේය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ: “චී, චී, එය විසිකරනු. සැබැවින්ම අපි සකාත් දෑ අනුභව නොකළ යුතු බව ඔබ නොදන්නෙහි ද?“ යැයි පැවසූහ. තවත් වාර්තාවක, “සැබැවින්ම අපට සකාත් භාණ්ඩ අනුමත
නොවේ.“ යැයි සඳහන්ව ඇත.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත - බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

හසන් ඉබ්නු අලී (රළියල්ලාහු අන්හු) තුමා සකාත් වශයෙන් රැස් කර තිබූ රට ඉඳිවලින් ඉඳිගෙඩියක් ගෙන තම කට තුලට දැමුවේය. එවිට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කහ් කහ් (චි චි) යැයි පැවසූහ. එනම්: එය ඔබට සුදුසු නැත. පසුව එය තම කටින් එළියට ගන්නා මෙන් නියෝග කළහ. සකාත් භාණ්ඩ මුහම්මද් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ පවුලේ උදවියට අනුමත නොවන්නකි. හේතුව ඔවුහු මිනිසුන් අතර සිටි ශ්රේෂ්ඨයින් වෙති. සදකාවන් හා සකාත් මිනිසුන්ගේ කිලිටිය. ජනයාගේ කිලිටි හිමි කර ගැනීම ඔවුන් අතර සිටින ශ්රේෂ්ඨයින්ට සුදුසු නොවන්නේය. එය, නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා තම මහප්පා කෙනෙකු වූ අබ්බාස් ඉබ්නු අබ්දුල් මුත්තලිබ්ට පවසා සිටියාක් මෙනි. එනම්: “නියත වශයෙන්ම අපි මුහම්මද්ගේ පවුලේ උදවිය වෙමු. අපට සකාත් භාණ්ඩ අනුමත නොවන්නේය. නියත වශයෙන්ම ඒවා මිනිසුන්ගේ කිලිටිය.“

https://sunnah.global/hadeeth/si/show/10102